- **දුවේ පුතේ"**
- **නිදහස් උත්සවය ගැන තිබෙන මේ ඡේදය කියවන්න**

## අපේ නිදහස් උත්සවය

කවිඳු යාළුවොත් එක්ක මිදුලේ සෙලල්ම් කරමින්සිටියා යා. ''පුතා යාළුවොත් එක්ක මෙහෙට එන්න'' කවිඳුගේ අම්මා කතා කළා. කවිඳු යාළුවොත් එක්ක ගේ ඇතුළට ආවා. අම්මා රූපවාහිනිය බලනවා. රූපවාහිනියෙ ලොකු උත්සවයක් පෙන්වනවා. හමුදා පෙළපාලි, යුද්ධ ටැංකි, අහසේ කරණම් ගසන ගුවන් යානා, පැරෂුට් භටයෝ, තවත් බොහෝ දේවල් රූපවාහිනිය මත දිග හැරෙනවා. කවිඳුටයි යාළුවන්ටයි මේක හරි ම ප්‍රහේලිකාවක්. ඒ හින්දා ම කවීශා ප්‍රශ්නයක් ඇහුවා. ''මොකක් ද නැන්දේ මේ උත්සවය ?'' ''ඒ'' පුතේ අපේ රටේ නිදහස් උත්සවය.''''මොකක් ද නිදහස් උත්සවය කියන්නේ ?'' ඒ ප්‍රශ්නය ඇහුවෙත් කවීශා ම යි. ''හැමෝම අහන්නකෝ'' කවිඳුගේ අම්මා උත්තර දෙන්න සූදානම් වුණා. ''අපේ රට 1815 අවුරුද්දේ ඉඳලා ඉංග්‍රීසි ජාතිකයන්ගේ පාලනය යටතෙයි තිබුණේ. 1948 පෙබරවාරි හතරවැනි දා අපි ඔවුන්ගෙන් නිදහස් වුණා. ඊට පස්සෙ හැම අවුරුද්දක ම පෙබරවාරි හතරවැනි දා අපි නිදහස් දිනය උත්සවාකාරයෙන් සමරනවා. එක් අපෙ ් රටේ පවතව් න ජාතකි උත්සවයක් '' ''ඒ හින්දා ද අම්මේ තාත්තා අද ජාතික කොඩියක් එල්ලුවේ.?'' ඒ ප්‍රශ්නය ඇහුවේ කවිඳු. ''අන්න හරි නිදහස් දිනය දවසට ලංකාවේ අපි හැමෝම හැම ගෙදරක ම ජාතික කොඩිය ප්‍රදර්ශනය කරනවා. නිදහස් උත්සවය පවත්වන්නේ අපේ අභිමානය ලෝකෙට ම පෙන්නයි ඒ ජාතික උත්සවය තමයි පුතේ ඔය රූපවාහිනියේ පෙන්වන්නේ '' කවිඳුගේ අම්මා උත්තර දුන්නා. යාළුවන් හැම දෙනා ම නිදහස් උත්සවය බැලුවා.

- **ඡේදයේ සඳහන් තොරතුරු ඇසුරින් ප්‍රශ්න කිහිපයක් අසා පිළිතුරු ලබා ගන්න.**

1)රූපවාහිනියේ පෙන්වන උත්සවයේ දුටු දේවල් මොනවා ද ?............................................
2)අපේ රටට නිදහස ලැබුණේ කවරදා ද ?....................................................................

- ඡේදය ඇසුරින් නිදහස් උත්සවය ගැන වාක්‍ය පහක් ලියන්න.

1)....................................................................................................................................

2)....................................................................................................................................

3)....................................................................................................................................

4)....................................................................................................................................

5)....................................................................................................................................